සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2021 ජූලි

## (201) උසස් මූල්‍ය ගිණුම්කරණය සහ පිරිවැයකරණය

(Advanced Financial Accounting & Costing)

2021-10-23
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.5 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන්, පිරිවැය ගිණුම්කරණය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) එය ඓතිහාසික සිදුවීම් සහ ගනුදෙනු මත පදනම් වේ.

(2) එය ඒකකයක පිරිවැය තීරණය කරයි.

(3) එය නීතිමය අවශ්‍යතාවයන්ට අනුව වාර්තා පිළියෙළ කරයි.

(4) එය බාහිර පාර්ශවයන්ට පමණක් තොරතුරු සපයයි. (ලකුණු 02)

1.2 පහත සඳහන් සිදුවීම් වාර්තාකරන දිනයට පසුව නමුත් මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමට පෙර සිදුවී තිබේ. පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10 (LKAS 10) - වාර්තාකරන කාලපරිච්ඡේදයට පසු සිදුවීම්, අනුව ගැලපිය යුතු **නොවන** සිද්ධියක් වන්නේ කුමක් ද?

(1) සමාගමට ණයගැතියෙක් වූ ගනුදෙනුකරුවෙක් බංකොලොත්භාවයට පත්වීම.

(2) ප්‍රධාන නිෂ්පාදන පිරියතක් ගින්නකින් විනාශ වීම.

(3) මූල්‍ය ප්‍රකාශන වැරදි බවට පත්කරන වංචාවක් වාර්තාකරන කාලපරිච්ඡේදයෙන් පසුව සොයා ගැනීම.

(4) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තාකරන ලද අගයට වඩා අඩු අගයකට තොගයෙන් කොටසක් විකිණීම.

(ලකුණු 02)

**1.3** පහත සඳහන් තොරතුරු, **සීමාසහිත මැක්ස් (පෞද්ගලික) සමාගමේ,** 2021 අප්‍රේල් මාසය සඳහා වාර්තාවලින් උපුටාගන්නා ලදි:

| | |
|---|---|
| 2021 අප්‍රේල් 01 දිනට තොගය | රු.170,000/- |
| 2021 අප්‍රේල් 30 දිනට තොගය | රු.240,000/- |
| ගැනුම් | රු.910,000/- |
| දළ ලාභය | විකුණුම් මත 40% |

2021 අප්‍රේල් 30 දිනෙන් අවසන් වූ මාසය සඳහා විකුණුම් වූයේ:

(1) රු.1,176,000/-. (2) රු.2,210,000/-.

(3) රු.1,800,000/-. (4) රු.1,400,000/-. (ලකුණු 02)

**1.4** **සීමාසහිත රෝසි සමාගම,** 2018 අප්‍රේල් 01 දින රු.3,600,000/- ක පිරිවැයකට මෝටර් රථයක් අත්පත් කර ගන්නා ලදි. මෝටර් රථයේ ඇස්තමේන්තුගත ඵලදායි ජීව කාලය වසර 5 ක් වන අතර, සමාගම පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය ප්‍රතිපාදනය කරනු ලබයි. 5 වන වර්ෂය අවසානයේදී මෝටර් රථයේ සුන්බුන් අගය රු.100,000/- ක් ලෙස ඇස්තමේන්තුගත කර තිබේ. 2021 මාර්තු 31 දිනට මෝටර් රථයේ ධාරණ අගය වන්නේ:

(1) රු.1,500,000/-. (2) රු.2,100,000/-.

(3) රු.1,440,000/-. (4) රු.2,160,000/-.

(ලකුණු 02)

**1.5** පහත තොරතුරු සළකා බලන්න:

| | |
|---|---|
| **X නිෂ්පාදිතය** සඳහා වාර්ෂික ඉල්ලුම | ඒකක 20,000 |
| ඇණවුමක් සඳහා ඇණවුම් පිරිවැය | රු.200/- |
| ඒකකයක වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය | රු.0.50 |

ඔබට පහත සූත්‍රය භාවිත කළ හැක,

$$EOQ = \sqrt{\frac{2DC_0}{C_h}}$$

**X නිෂ්පාදිතයේ** ආර්ථික ඇණවුම් ප්‍රමාණය [Economic Order Quantity (EOQ)] වන්නේ:

(1) ඒකක 3,800 කි. (2) ඒකක 4,500 කි. (3) ඒකක 4,000 කි. (4) ඒකක 2,000 කි.

(ලකුණු 02)

*අංක **1.6** සිට **1.10** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.6** ශ්‍රී ලංකාවේ හවුල් ව්‍යාපාර සඳහා අදාළ වන නීති / රෙගුලාසි දෙකක්(02) ලැයිස්තුගත කරන්න. (ලකුණු 02)

**1.7** සංකලිත ගිණුම්කරණ පද්ධතියක (Integrated Accounting System) වාසි දෙකක්(02) සඳහන් කරන්න.

(ලකුණු 02)

**1.8** සීමාසහිත පෞද්ගලික සමාගමක් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණුවලට අදාලව 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධානයන් සඳහන් කරන්න:

(i) අවම කොටස්හිමියන් සංඛ්‍යාව.

(ii) උපරිම අධ්‍යක්ෂකවරුන් සංඛ්‍යාව. (ලකුණු 03)

1.9 පහත තොරතුරු, **සීමාසහිත XYZ (පෞද්ගලික) සමාගමේ** පොත්වලින් උපුටාගෙන තිබේ:

| | |
|---|---|
| දිනකට සාමාන්‍ය වැඩකරන පැය | පැය 8 |
| පැයක මූලික වේතන අනුපාතය | රු.300/- |
| එක් (1) ඒකකයක් නිෂ්පාදනය කිරීමට ඉඩදී ඇති ප්‍රමිත කාලය | මිනිත්තු 5 |
| ප්‍රසාද දීමනාව | ඉතිරි කළ කාලයෙන් 75% ක් මූලික වේතන අනුපාතයට |

සේවකයෙක් පසුගිය මාසය තුළදී ඒකක 2,040 නිෂ්පාදනය කළ අතර, පසුගිය මාසය තුළදී ඔහු දින 20 ක් වැඩකර තිබේ.

පසුගිය මාසය සඳහා සේවකයාගේ මුළු ඉපැයීම් ගණනය කරන්න. (ලකුණු 04)

1.10 පහත සඳහන් තොරතුරු, 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා **සීමාසහිත ටෝයි (පෞද්ගලික) සමාගමේ** වාර්තාවලින් උපුටාගන්නා ලදී:

| | **රු.** |
|---|---|
| විකුණුම් | 5,400,000 |
| එකතුකළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිලට ගත් අමුද්‍රව්‍ය | 2,160,000 |
| එකතුකළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් වෙනත් මිලට ගැනීම් | 324,000 |

- සියලුම අගයන් එකතුකළ අගය මත බදු (VAT) රහිතව වන අතර, VAT අනුපාතය 8% කි.
- 2021 ජනවාරි 01 දිනට එකතුකළ අගය මත බදු (VAT) පාලන ගිණුමේ බැර ශේෂය රු.48,000/- ක් විය.

එකතුකළ අගය මත බදු (VAT) පාලන ගිණුම පිළියෙළ කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

(මුළු ලකුණු 50)

## 02 වන ප්‍රශ්නය

**නිසලට** අයිති සිල්ලර වෙළෙඳසැලක් වන **නිසල ට්‍රේඩර්ස්හි** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන තිබේ:

(1) වත්කම් සහ වගකීම් පහත දැක්වේ: *(රු.'000)*

| | **2021 මාර්තු 31 දිනට** | **2020 අප්‍රේල් 01 දිනට** |
|---|---|---|
| ඉඩම සහ ගොඩනැගිල්ල - ධාරණ අගයට | 10,800 | 11,250 |
| මෝටර් වාහන - ධාරණ අගයට | 16,650 | 15,750 |
| තොගය | 5,400 | 5,625 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 6,075 | 6,300 |
| බැංකුවේ ඇති මුදල් | ? | 2,925 |
| බැංකු ණය | 1,000 | - |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 3,040 | 3,600 |
| උපචිත විදුලිය | 380 | 495 |

(2) **තිසල,** නිසි පරිදි ගිණුම් පොත් පවත්වා නොගනී. 2020 අප්‍රේල් 01 දින සිට 2021 මාර්තු 31 දින දක්වා ඔහුගේ බැංකු ප්‍රකාශනවලින් පහත සඳහන් සාරාංශගත තොරතුරු උපුටාගන්නා ලදි:

| | රු. |
|---|---|
| **බැංකුවේ තැන්පත් කරන ලද මුදල්:** | |
| අත්පිට මුදලට විකුණුම් | 7,875,000 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල්වලින් ලැබීම් | 5,625,000 |
| බැංකු ණය | 1,000,000 |
| **චෙක්පත් මගින් සිදුකල ගෙවීම්:** | |
| අත්පිට මුදලට ගැනුම් | 2,812,500 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් සඳහා ගෙවීම් | 3,375,000 |
| විදුලිය | 562,500 |
| කාර්යාල නඩත්තු | 630,000 |
| වැටුප් හා වේතන | 3,892,500 |
| මෝටර් වාහනයක් මිලදී ගැනීම (2021 මාර්තු 31 දින මිලට ගත්) | 2,250,000 |

(3) **තිසල,** සියලු මුදල් ලැබීම් බැංකු ගිණුමට තැන්පත් කර තිබෙන අතර, සියලුම ගෙවීම් චෙක්පත් මගින් පමණක් සිදුකර තිබේ.

(4) 2021 මාර්තු 01 දින, රු.1,000,000/- ක බැංකු ණයක් ලබාගෙන තිබේ. වාර්ෂිකව 9% ක පොලී අනුපාතයක් යටතේ පොලී ගෙවන අතර, ණය මුදලේ පළමු වාරිකය 2021 අප්‍රේල් 01 දින ගෙවන ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**තිසල ට්‍රේඩර්ස්** හි 2021 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## **03** වන ප්‍රශ්නය

**දමිත්** සහ **උදිත්** ලාභ'ලාභ පිළිවෙලින් 2:1 අනුපාතයට බෙදාගනිමින් **DU ෆැශන්** නම් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. 2020 ජනවාරි 01 දින, රු.8,000,000/- ක මූලික මුදල් ආයෝජනයක් සමඟ **මීනා** නව හවුල්කරුවෙකු වශයෙන් හවුල් ව්‍යාපාරයට ඇතුළත් විය.

(1) පහත සඳහන් ශේෂයන් හවුල් ව්‍යාපාරයේ පොත්වලින් උපුටාගෙන තිබේ:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| 2020 ජනවාරි 01 දිනට ප්‍රාග්ධන ගිණුම්: | | |
| **දමිත්** | | 12,000 |
| **උදිත්** | | 8,000 |
| 2020 ජනවාරි 01 දින **මීනා** රැගෙන ආ ප්‍රාග්ධනය | | 8,000 |
| 2020 ජනවාරි 01 දිනට ජංගම ගිණුම්: | | |
| **දමිත්** | | 1,500 |
| **උදිත්** | 800 | |
| 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ගැනිලි: | | |
| **දමිත්** | 900 | |

(2) 2020 ජනවාරි 01 දින, හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.2,400,000/- කට අගය කරන ලද අතර, එය කීර්තිනාම ගිණුමක් විවෘත නොකර හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා ගැලපීමට තීරණය කරන ලදී.

(3) හවුල් ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම් 2020 ජනවාරි 01 දින පහත සඳහන් පරිදි ප්‍රත්‍යාගණනය කරන ලදී:

*(රු.'000)*

| | **2020 ජනවාරි 01 දිනට ප්‍රත්‍යාගණිත අගය** | **පිරිවැය** | **2020 ජනවාරි 01 දිනට සමුච්චිත ක්ෂය** |
|---|---|---|---|
| ඉඩම සහ ගොඩනැගිලි | 6,000 | 4,000 | 600 |
| මෝටර් වාහන | 1,400 | 2,000 | 1,000 |

ජංගම නොවන වත්කම්, ප්‍රත්‍යාගණිත අගයන් යටතේ හවුල් ව්‍යාපාරයේ ගිණුම්වල පවත්වාගෙන යාමට එකඟවන ලදී.

(4) නව හවුල් ව්‍යාපාර ගිවිසුමෙහි පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- 2020 ජනවාරි 01 දිනට ඇති ප්‍රාග්ධන ගිණුම්වල ශේෂයන් මත වාර්ෂිකව 10% බැගින් වූ ප්‍රාග්ධන පොලියක් ගෙවනු ලැබේ.
- **උදිත්** ට මාසිකව රු.40,000/- ක වැටුපක් ලැබීමට හිමිකම් ඇත.
- **දමිත්, උදිත්** සහ **මීනා** අතර, ලාභ'ලාභ පිළිවෙළින් 4 : 3 : 3 අනුපාතයට බෙදාගත යුතුය.

(5) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු.6,480,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්. (ලකුණු 05)

(b) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

පහත සඳහන් තොරතුරු 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **ග්‍රීන් ගොල්ෆ් ක්‍රීඩා සමාජයෙහි** පොත්වලින් උපුටාගෙන තිබේ:

(1) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **ග්‍රීන් ගොල්ෆ් ක්‍රීඩා සමාජයෙහි** ලැබීම සහ ගෙවීම් ගිණුම පහත දැක්වේ:

**ලැබීම් සහ ගෙවීම් ගිණුම** *(රු.'000)*

| | | | |
|---|---|---|---|
| 2020.01. 01 ඉ/ගෙ ශේෂය | 15,300 | දුරකතන වියදම් | 1,010 |
| පරිත්‍යාග | 1,575 | විදුලිය | 3,150 |
| සාමාජික ගාස්තු | 20,025 | පුහුණුකිරීමේ ගාස්තු | 4,725 |
| අවන්හලේ විකුණුම් | 60,000 | වෙනත් පරිපාලන වියදම් | 2,250 |
| | | අවන්හලේ සැපයුම්කරුවන්ට කළ ගෙවීම් | 38,700 |
| | | ක්‍රීඩා උපකරණ | 5,250 |
| | | 2020.12.31 ඉ/ගෙ ශේෂය | 41,815 |
| | **96,900** | | **96,900** |

(2) ක්‍රීඩා සමාජයේ අනෙකුත් වත්කම් සහ වගකීම් පහත දැක්වේ: *(රු.'000)*

| | 2020 දෙසැම්බර් 31 දිනට | 2020 ජනවාරි 01 දිනට |
|---|---|---|
| ඉඩම සහ ගොඩනැගිල්ල - ධාරණ අගයට | 100,000 | 120,000 |
| ක්‍රීඩා උපකරණ - ධාරණ අගයට | 26,250 | 24,000 |
| තොගය | 10,500 | 7,500 |
| හිඟ සාමාජික ගාස්තු | 900 | 1,350 |
| කලින් ලැබුණු සාමාජික ගාස්තු | 675 | 450 |
| අවන්හලේ සැපයුම්කරුවන්ට ගෙවිය යුතු මුදල් | 18,000 | 12,000 |

(3) පරිත්‍යාග, වර්ෂය සඳහා ආදායමක් වශයෙන් හඳුනාගත යුතුය.

(4) ක්‍රීඩා උපකරණ මිලට ගැනීම හැර වර්ෂය තුළදී ක්‍රීඩා සමාජයට දේපළ, පිරියත සහ උපකරණ අළුතින් මිලදී ගැනීම් හෝ ඉවත්කිරීම් කිසිවක් සිදුකර නොමැත.

(5) විදුලි වියදමෙන් 1/3 ක් සහ වෙනත් පරිපාලන වියදම්වලින් රු.1,125,000/- ක් අවන්හලේ මෙහෙයුම් යටතේ ගිණුම්ගත කළ යුතුය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**ග්‍රීන් ගොල්ෆ් ක්‍රීඩා සමාජයට** අදාලව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න:**

(a) අවන්හල් වෙළෙඳ ගිණුම. (ලකුණු 03)

(b) ආදායම් සහ වියදම් ගිණුම. (ලකුණු 07)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(A) **PQ ගාමන්ට්ස්,** ටී ෂර්ට් (T-shirts) එකක් රු.750/- ක මිලක් යටතේ ටී ෂර්ට් 1,000 ක් සැපයීමට ඇණවුමක් භාර ගත්තේය.

මෙම ඇණවුම සම්බන්ධව පහත සඳහන් තොරතුරු සපයා තිබේ:

(1) ටී ෂර්ට් එකකට මීටර් 0.45 ක රෙදි අවශ්‍ය වන අතර, අදාළ රෙදි මීටරයක් රු.700/- ක් බැගින් මිලට ගත හැක.

(2) ටී ෂර්ට් එකක ඇසුරුම් පිරිවැය රු.25/- කි.

(3) පැයක සෘජු ශ්‍රම පිරිවැය රු.200/- ක් වන අතර, ටී ෂර්ට් එකක් නිපදවීමට සෘජු ශ්‍රම පැය 0.5 ක් අවශ්‍ය වේ.

(4) ටී ෂර්ට් එකක් සඳහා නිෂ්පාදන පොදුකාර්ය, සෘජු ශ්‍රම පිරිවැයෙන් 50% කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ටී ෂර්ට් එකක පිරිවැය **ගණනය කරන්න**. (ලකුණු 03)

(b) මෙම ඇණවුමේ ලාභය හෝ අලාභය **ගණනය කරන්න**. (ලකුණු 02)

(B) **සීමාසහිත ඩිලන්කා (පෞද්ගලික) සමාගම,** සංකලිත ගිණුම්කරණ පද්ධතියක් ක්‍රියාත්මක කරයි.

පහත සඳහන් තොරතුරු 2021 මැයි මාසය සඳහා **සීමාසහිත ඩිලන්කා (පෞද්ගලික) සමාගමේ** ගිණුම් පොත්වලින් උපුටා ගන්නා ලදී:

(1) 2021 මැයි 01 දිනට තොග අගය කිරීම පහත සඳහන් පරිදි විය: *(රු.)*

| | **2021 මැයි 01 දිනට** |
|---|---|
| අමුද්‍රව්‍ය | 42,000 |
| නොනිමි වැඩ [Work-in-progress (WIP)] | 32,000 |

(2) 2021 මැයි මාසය තුළදී පහත සඳහන් ගනුදෙනු සිදුවිය:

| | **රු.** |
|---|---|
| අමුද්‍රව්‍ය ණයට ගැනුම් | 325,000 |
| නිෂ්පාදනය සඳහා නිකුත්කළ අමුද්‍රව්‍ය | 275,000 |
| නිෂ්පාදනය සඳහා ගෙවූ සෘජු වේතන | 120,000 |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 145,000 |
| නිමි භාණ්ඩවල නිෂ්පාදන පිරිවැය | 545,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) අමුද්‍රව්‍ය තොග පාලන ගිණුම. (ලකුණු 02)

(b) නොනිමි වැඩ [Work-in-progress (WIP)] පාලන ගිණුම. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

මෝටර් රථ සඳහා සොරකම් විරෝධී උපාංග (antitheft device) නිෂ්පාදකයෙකු වන **සීමාසහිත ටෙක්නෝ ලංකා (පෞද්ගලික) සමාගමට** නිෂ්පාදන දෙපාර්තමේන්තු (නිෂ්පාදන සහ ඇසුරුම්) දෙකක් සහ එක් සේවා දෙපාර්තමේන්තුවක් (තාක්ෂණික) තිබේ.

(1) සමාගම, එහි වාර්ෂික නිෂ්පාදන පොදුකාර්ය වන රු.18,000,000/-, පහත සඳහන් පරිදි ඇස්තමේන්තුගත කර තිබේ:

| **පිරිවැය අයිතමය** | **පිරිවැය (රු.)** |
|---|---|
| යන්ත්‍ර ක්ෂය | 6,500,000 |
| කර්මාන්තශාලා කුලිය | 4,800,000 |
| තත්ත්ව පරීක්ෂණ පිරිවැය | 1,500,000 |
| විදුලිය | 5,200,000 |
| **මුළු නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය** | **18,000,000** |

(2) එක් උපාංගයක් සඳහා ඇස්තමේන්තුගත සෘජු පිරිවැය පහත සඳහන් පරිදි වේ:

| ඒකකයකට | (රු.) |
|---|---|
| සෘජු ද්‍රව්‍ය | 1,500 |
| සෘජු ශ්‍රමය | 2,100 |
| **ප්‍රාථමික පිරිවැය** | **3,600** |

(3) පොදුකාර්ය විභජන පදනම් පහත දැක්වේ:

| **පදනම** | **නිෂ්පාදන දෙපාර්තමේන්තු** | | **සේවා දෙපාර්තමේන්තු** | **එකතුව** |
|---|---|---|---|---|
| | **නිෂ්පාදන** | **ඇසුරුම්** | **තාක්ෂණික** | |
| යන්ත්‍ර පැය | 12,000 | 8,000 | 5,000 | 25,000 |
| බිම් ප්‍රමාණය (වර්ග අඩි) | 2,000 | 1,500 | 1,500 | 5,000 |
| විදුලිය (කිලෝ වොට්) | 15,000 | 8,000 | 2,000 | 25,000 |
| තත්ත්ව පරීක්ෂණ ගණන | 8 | 4 | - | 12 |
| සෘජු ශ්‍රම පැය (පැය) | 10,000 | 8,000 | - | - |
| පිරිවැය විභජනය - තාක්ෂණික | 65% | 35% | - | - |
| ඒකකයකට සෘජු ශ්‍රම පැය ගණන | 1.5 | 2 | - | - |

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) නිෂ්පාදන දෙපාර්තමේන්තු සඳහා පොදුකාර්ය පිරිවැය වෙන්කර විභජනය කරනු ලබන්නේ කෙසේදැයි පෙන්වීම සඳහා ප්‍රකාශයක් **පිළියෙළ කරන්න**. (ලකුණු 05)

(b) සෘජු ශ්‍රම පැය ගණන පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ ඇසුරුම් දෙපාර්තමේන්තු සඳහා පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාත **ගණනය කරන්න**. (ලකුණු 03)

(c) සොරකම් විරෝධී උපාංගයක (antitheft device) ඇස්තමේන්තුගත මුළු පිරිවැය **ගණනය කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

<u>C කොටස</u>

(මුළු ලකුණු 25)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත ඩ්‍රීම් සෝන් (පෞද්ගලික) සමාගමේ,** 2021 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

*(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 1,000,000) | | 10,000 |
| 2020 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම් | | 7,834 |
| 2020 අප්‍රේල් 01 දිනට, පොදු සංචිතය | | 3,200 |
| පිරියත සහ උපකරණ පිරිවැයට: | | |
| මෝටර් වාහන | 25,000 | |
| යන්ත්‍ර | 22,500 | |
| කාර්යාල උපකරණ | 1,500 | |
| 2020 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| මෝටර් වාහන | | 13,125 |
| යන්ත්‍ර | | 3,000 |
| කාර්යාල උපකරණ | | 300 |
| 2021 මාර්තු 31 දිනට, තොගය | 1,050 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 2,870 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 1,873 |
| අතැති මුදල් සහ බැංකුවේ මුදල් | 1,057 | |
| 14% ණයකර | | 5,000 |
| විකුණුම් | | 31,520 |
| විකුණුම් පිරිවැය | 15,391 | |
| වැටුප් සහ වේතන | 1,800 | |
| විදුලිය | 400 | |
| කාර්යාල කුලිය | 600 | |
| දුරකතන | 900 | |
| කාර්යාල නඩත්තු | 250 | |
| ප්‍රචාරණය | 800 | |
| අලෙවි කණ්ඩායම සඳහා විකුණුම් කොමිස් | 1,025 | |
| ගෙවූ ණයකර පොලිය | 350 | |
| වෙනත් මූල්‍ය වියදම් | 29 | |
| 2020/21 වර්ෂය සඳහා ආදායම් බදු වියදම | 330 | |
| | **75,852** | **75,852** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2021 මාර්තු 31 දිනට, තොගයේ ශුද්ධ උපලබ්ධි අගය [Net Realizable Value (NRV)] රු.950,000/- කි.

(2) 2020 අප්‍රේල් 01 දින, සමාගම විසින් එකක් රු.100/- බැගින් වූ 14% ණයකර 50,000 ක් නිකුත් කරන ලදී. පොලිය අර්ධවාර්ෂිකව (bi-annually) ගෙවිය යුතු වේ.

(3) පිරිවැය රු. මිලියන 3 ක් වූ මෝටර් රථයක් 2021 ජනවාරි 01 දින අනතුරකට ලක්විය. මෙම මෝටර් රථය 2017 ජනවාරි 01 දින මිලටගෙන තිබෙන අතර, අනතුර නිසා මෝටර් රථය සම්පූර්ණයෙන් හානියට පත්විය. රක්ෂණ සමාගම රක්ෂණ වන්දිය වශයෙන් මෝටර් රථයේ පිරිවැයෙන් 80% ක් ගෙවීමට 2021 මාර්තු 31 දින එකඟ විය. මේ සම්බන්ධයෙන් කිසිදු සටහනක් සිදුකර නොතිබුණි.

(4) පිරියත සහ උපකරණ සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත ක්ෂය කරනු ලබන අතර, පිරියත සහ උපකරණවල ඵලදායි ආයු කාලය පහත දැක්වේ:

| | |
|---|---|
| මෝටර් වාහන | වර්ෂ 04 |
| යන්ත්‍ර | වර්ෂ 08 |
| කාර්යාල උපකරණ | වර්ෂ 05 |

(5) 2021 මාර්තු 31 දිනට පහත සඳහන් උපචිත සහ කලින් ගෙවූ වියදම් ගිණුම්ගත කළ යුතු වේ:

| | රු. |
|---|---|
| කලින් ගෙවූ ප්‍රචාරණය | 8,000 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | 70,000 |

(6) කොවිඩ්-19 (COVID-19) වසංගත තත්ත්වය නිසා සමහර ගනුදෙනුකරුවන්ගේ ගෙවීම් පිළිබඳව ඇති විශ්වසනීයත්වය සම්බන්ධයෙන් සැකයක් පවතී. එමනිසා 2021 මාර්තු 31 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 10% ක ප්‍රතිපාදනයක් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබේ.

(7) මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021 මැයි 31 දින අනුමැතිය ලබාදෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**ඩ්‍රීම් සෝන් (පෞද්ගලික) සමාගමේ,** කළමනාකාරිත්වයේ භාවිතය සඳහා, පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ/ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 13)

(b) 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 12)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අදින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනඟා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |